# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1919/41 – 2015 ජුනි 17 වැනි බදාදා – 2015.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද සියපත්තුව සුළු කොට්ඨාසයේ, මැදවල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/එච්ආර්එස්/2014/422 සහ 2014.10.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0075 ක් පමණ වන ගල්පඩිගාව වත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – ගල්පඩිගාව වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0075 ක් පමණ

උතුරට: මාර්ගය (ප්‍රා.ස.); නැගෙනහිරට: දුල්වල රන්කොත්ගෙදර සෝමාවතී හිමිකම් කියන ගල්පඩිගාව වත්ත සහ ඒ. බී. ජී. නෙවිල් ප්‍රියන්ත බුළුකුඹුර හිමිකම් කියන ගල්පඩිගාව වත්ත; දකුණට: ඒ. බී. ජී. නෙවිල් ප්‍රියන්ත බුළුකුඹුර හිමිකම් කියන ගල්පඩිගාව වත්ත, දුල්වල රන්කොත්ගෙදර සෝමාවතී හිමිකම් කියන ගල්පඩිගාව වත්ත සහ මාර්ගය (ප්‍රා.ස.); බටහිරට: මාර්ගය (ප්‍රා.ස.).

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

යොමු අංකය: 4-3/9/2014/ඩබ්එස්/16.
2015 මැයි මස 13 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 121


1A – G21700– 12 (2015/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*